# උරුමයක උල්පත් 29

පූජ්‍ය බණ්ඩාරවෙල අමිතානන්ද හිමිපාණන්

***ප්‍රශ්නය : අවසරයි ස්වාමින්වහන්ස, වැඩිහිටියන්ට ධර්ම දේශනා කිරීමෙන් විශාල ප්‍රයෝජනයක් නොලැබෙන බවට ඔබ වහන්සේ මතයක් තිබෙන බව ප්‍රකාශ කර සිටියා. ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කළොත්?***

පිළිතුර : අපි භික්ෂූන් වහන්සේලා හැටියට මනුෂ්‍යයෙන්ගේ හිත් සමඟ බොහෝ සමීපයෙන් ජීවත් වන පිරිසක්. ඔවුන්ගේ ජීවිත දෙස බලන විට රාගයෙන් රත්වෙලා. ද්වේශයෙන් බර වෙලා. මෝහයෙන් අන්ධ වෙලා. ඔවුන් සමඟ කටයුතු කරන විට ඔවුන්ගේ හැඟීම් හඳුනාගත යුතුයි. විශේෂයෙන් ජනතාවට නායකත්වය දෙන භික්ෂුව හෝ යම් පුද්ගලයෙක් කටයුතු කළ යුත්තේ ජනතාවගේ හැඟීම් හඳුනාගෙන. යාපනය, ත්‍රිකුණාමලය ඇතුළුව රටේ හැම ප්‍රදේශයකම මම ධර්මය දේශනා කර තිබෙනවා. වැඩිහිටි පුද්ගලයන් සුමගට යොමු කර ගන්නවාට වඩා රත්තරන් තරුණ දුවලා, පුතාලා අවදි කරවා ගැනීම වඩා පහසු බව මේ ධර්ම දේශනා තුළදී මා දුටු එක් දෙයක්.

නොයෙක් අදහස් වලින් අපේ වැඩිහිටියන්ගේ මනස හෙම්බත් වෙලා. ඒ නිසා ඔවුන් ගත් සමහර තීරණ ඔවුන් වෙනස් කර ගන්න බැහැ. තරුණ පිරිස් ඉදිරියට ගැනීමට නම් අපි තරුණ හිත් හඳුනාගෙන, තරුණ දරුවන්ගේ එදිනෙදා ප්‍රශ්න දෙස විමසිල්ලෙන් බලා ඔවුන් පීඩනයට ලක් වෙන තැන මුදවා ගැනීම අපි කළ යුතුයි. ඒ නිසා වැඩිහිටියන් සුමගට ගැනීමට වඩා තරුණ පිරිස් සුමගට ගැනීම පහසුයි.

මේ යුගයේ විශාල පෙරළියක් තිබෙනවා. අද තරුණන් අධ්‍යාත්මික සැනසිල්ල පිළිබඳව සොයන්න පුරුදුව සිටිනවා. වැඩිහිටියන් අමතක කරනවා නොවෙයි. වැඩිහිටියන්ගේ අවවාද අනුශාසනා යටතේ කටයුතු කරමින් තරුණ ජනතාවට මඟ පෙන්වීමට අපි උත්සාහ කළ යුතුයි. නැවත වාරයක් බුද්ධියෙන්, නුවණින් පිරි තරුණ පෙළක් අපේ රට තුළ අවදි කරවා ගතහොත් රටේ ඉදිරි කටයුතු පහසු වෙනවා.

ප්‍රශ්නය : මේ දර්ශනය ප්‍රායෝගිකව ඉදිරියට ගෙන යන්න ඇති හැකියාව කොහොමද ස්වාමින්වහන්ස?

පිළිතුර : ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මේ ලෝකයට දේශනා කළ දහම අද්විතීයයි. මනුෂ්‍යයෙක් හැටියට ඉපිද, මනුෂ්‍යයෙක් හැටියට ජීවත් වෙලා වයස අවුරුදු තිස්පහ වන විට

උන්වහන්සේ මේ බුද්ධිමය පෙරළිය සිදු කළා. බුදුරජාණන් වහන්සේ මනුෂ්‍යයන්, දෙවියන්, බ්‍රහ්මයන් අතර අග්‍ර බුද්ධියක් ගොඩ නගා තිබෙනවා. තුන්ලෝකාග්‍ර සම්මා සම්බුද්ධ යනුවෙන් ප්‍රකාශ කරන්නේ ඒ නිසයි. උන්වහන්සේ මේ පණිවිඩය ලොවට දුන්නේ වයස අවුරුදු තිස්පහේදීය. මේ භද්‍ර යෞවනත්වයෙන් ලෝකය මොන තරම් වෙනස් කිරීමට හැකි ද්‍රියි කියා බුදුරජාණන් වහන්සේගෙන් උදාහරණයක් ලබා ගන්න පුළුවන්.

යෞවනත්වයේ සිටි බුදුරජාණන් වහන්සේ, තමන් වහන්සේගේ සිත හඳුනාගෙන, තමන් වහන්සේගේ සිතේ දුක නිවාගෙන අන් සියලු දෙනා ද දුකින් මුදවා ගැනීමට කටයුතු කළා. ඒ නිසා අපි භද්‍ර යෞවනත්වයට බුදු දහමේ පණිවිඩය ලබා දිය යුතුයි. නමුත් මේ පණිවිඩය සම්ප්‍රදායික ආකාරය ලබා දිය යුතු නැහැ. තරුණ හැඟීම් හඳුනාගෙන ඒ හැඟීමට, වැටහෙන, ද්‍රිනෙන භාෂාවෙන් මේ පණිවුඩය ලබා දිය යුතුයි. එදිනෙදා මනුෂ්‍ය ජීවිතයට බුදු දහමින් ප්‍රයෝජන ලබා ගත හැකි ආකාරයට ලබා දීම වැදගත්. අපේ රටේ අවුරුදු දහස් ගණනක සිට මේ කටයුතු සිදු කළේ එදිනෙදා ජීවිතය සමග සම්බන්ධතාවයක් නැති ආකාරයෙන්. නමුත් ද්‍රින් ඒ වෙනස් වීම පෙනෙන්න තිබෙනවා. ද්‍රින් තරුණයන්ට එදිනෙදා ජීවිතයේ දි බුදු බණ ප්‍රයෝජනයට ගෙන තමන්ගේ ආකල්ප සංකල්ප වෙනස් කර ගන්න හැකියාව තිබෙනවා. එදිනෙදා ජීවිතයේ දී බුදු දහම ඔහුට ගුරුවරයෙක් වෙනවා. මේ ආකාරයෙන් බුදු දහම ගුරු කොට ගැනීම ජනතාවට හුරු කළ යුතුයි. ඒ නිසා බුද්ධි ගෝචර දෙයක් ජනතාවට ලබා දෙන විට එය බොහෝම ඉක්මනට ලබා ගන්නවා.

***ප්‍රශ්නය : තරුණ සමාජය උනන්දු වන්නේ විනෝද වෙන්න, යම් දෙයක් දෙස මතු පිටින් බලන්න පමණයි කියා සමාජයේ සමහරක් තුළ මතයක් තිබෙනවා. නමුත් ඔබවහන්සේ සඳහන් කරන ආකාරයට අද අපේ තරුණ තරුණියන් ගැඹුරින් කල්පනා කරනවා.***

පිළිතුර : ඇත්ත වශයෙන්ම අද තරුණ තරුණියන් ගැඹුරින් කල්පනා කරනවා. අද අපේ රටේ බොහෝ පවුල් වල මෑණියන් පන්සල එක්ක යන්නේ, පියාව පන්සල යොමු කරන්නේ තරුණ දුව හෝ පුතා. ඒ ආකාරයේ විප්ලවයක් අද දහම තුළින් සිදුව තිබෙනවා. අතීතයේ දරුවන්ව පන්සලට ඇඳගෙන ගියේ වැඩිහිටියන්. නමුත් අද දෙමාපියන් දහමට යොමු කර ගන්නේ, බණ අහන්න පුරුදු කරවන්නේ දරුවන් විසින්. තරුණ දරුවන් වැඩිහිටියන්ට අවවාද කරන තරමට අද සමාජය වෙනස් වී තිබෙනවා. තරුණයන් මේ බුදුදහමින් පෝෂණය වී තිබෙනවා. අපි මොවුන් ඉදිරියට ගැනීමට කටයුතු කළ යුතුයි. ආදර්ශයක් නැති, අවවාදයක් කිරීමට නොහැකි, අනුශාසනයකට කිසිසේත් ගැලපෙන්නේ නැති පුද්ගලයන්ට කිසිදාක රට හදන්න බැහැ. ඒ නිසා අපේ මේ තරුණ ජනතාව අවදි කරවාගෙන ඒ තරුණයන් සුදුසු නායකත්වයක් වෙත ගොඩ නැගිය යුතුයි. අපි කක්කුටු දහමින් මිදිය යුතුයි. මහ කක්කුටුවා ඇදේට ගමන්

කොට පොඩි කක්කුටුවන්ට කෙලින් ගමන් කරන්න උපදෙස් දෙනවා. අද අපේ රට තුළ ක්‍රියාත්මක වන්නේ කක්කුටු දහමක්. මෙය වෙනස් කළ යුතුයි. අපි නිරන්තරයෙන් තරුණ තරුණියන් දහමට යොමු කරවාගෙන ඒ තුළින් හරි දේ ප්‍රිකිය යුතුයි. ධර්ම තුළින් ජීවිතාබෝධය ලබන පුද්ගලයා හැම අවස්ථාවකදීම සිතන්නේ, කථා කරන්නේ, ක්‍රියා කරන්නෙ නිවිලා. හතු පිපෙන්නා වගේ උගතුන් බිහි කිරීමෙන් රටට වැඩක් වෙන්නේ නැහැ. උගත්කම සමඟ බුද්ධියත් තිබිය යුතුයි. බුද්ධිමතුන් කථා කරන්නේ, සිතන්නේ නිවිලා. බුද්ධිමත් පුද්ගලාගේ ප්‍රකට ලක්‍ෂණය එයයි. මෙවැනි නිවුණ ජනතාවක් රට තුළ නැවත ඇති කිරීමට නම් අධ්‍යාත්මික සංවර්ධනයක් ජනතාව තුළ ඇති කළ යුතුයි. ඒ සඳහා බුදු දහමින් විශාල ප්‍රයෝජනයක් ගැනීමට හැකියාව තිබෙනවා.

***ප්‍රශ්නය : මේ තරුණ සමාජය තුළ ඇති වූ පරිවර්තනයට හේතු වූ කරුණු මොනවාද?***

පිළිතුර : තරුණයන් සත්‍ය දකිනවා. එය ලෝව හැම තැනම තාරුණ්‍ය තුළ තිබෙන දෙයක්. තරුණයා ඇත්ත දකින්න, කථා කරන්න, ඇත්ත සමඟ ජීවත් වෙන්න කැමතියි. තාරුණ්‍යයේ ස්වභාවය එයයි. තමන්ගේ මව, පියා වැරැද්දක් කළත් එය වරදක් ලෙස තරුණයා ප්‍රකාශ කරනවා. මේ තරුණ දරුවන් හැකිතාක් දුරට සම්මා දිට්ඨියට යොමු කළ යුතුයි. ඒ සම්මා දිට්ඨිය තුළින් සම්මා සංකල්පය ඇති කර ගන්න පුළුවන්. සම්මා සංකල්පනා ඇති වන තරමට සම්මා වාචා ඇති වෙනවා. මේ ආකාරයන් මුළු ආර්ය අෂ්ඨාංගික මාර්ගයම ඇති කර ගන්න පුළුවන්. ඒ නිසා අපි කළ යුත්තේ ප්‍රිකිම නිවැරදි කර ගැනීමයි. මේ ප්‍රිකීම පිළිබඳව බුදුරජාණන් වහන්සේ වටිනා කියමනක් දේශනා කොට තිබෙනවා. ''ජානතෝ අහං භික්ඛවේ පස්සතෝ'' ''මහණෙනි, ලේකයේ මනුෂ්‍යයාට ප්‍රිනීම ලැබී තිබෙන්නේ නොමිලේමයි. ප්‍රිනීමෙන් මනුෂ්‍යයා පරිපූර්ණ පුද්ගලයෙක් කරන්න බැහැ. නමුත් අපිට උගන්වන්නේ ''ප්‍රිනීම පුද්ගලයා පරිපූර්ණ කරයි'' කියා. නමුත් තුන්ලෝකාග්‍ර බුද්ධියකින් යුතු බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ ප්‍රිනීමෙන් පමණක් පරිපූර්ණ පුද්ගලයෙක් බිහි කරන්න නොහැකි බවයි. ප්‍රිනීමට ප්‍රික්මක් තිබිය යුතුයි. මේ ප්‍රික්ම මනුෂ්‍යයා උරා ගන්නා ක්‍රම දෙකක් තිබෙනවා. බොහෝ මනුෂ්‍යයෝ තීරණ ගන්නේ මසසින් බලලා. මසසින් බලනකොට යථාර්ථය තේරුම් ගන්න බැහැ. මේ මසසින් බලන ගමන්ම මනසින් බලන්නත් අපේ තරුණ පරපුරට හුරු කරන්න අවශ්‍යයි. අපේ නායකයන් මේ වටිනා දේ තේරුම් ගන්න නොහැකිව සිටිනවා.

අපේ රටේත් බොහෝ නායකයෝ තීරණ ගන්න මසසින් බලා. ඉන්දියාව වැනි රටවල් මසසින් බලන ගමන්ම මනසින් හිතන්නත් පුරුදු වී සිටිනවා. නමුත් අපේ රටේ එවැනි දෙයක් නැහැ. ඒ නිසා සරල දේවල් වලට අපි මුලා වෙනවා. ඒ නිසා මනසින් බලන්න අපි ජනතාව හුරු කළ යුතුයි.

***ප්‍රශ්නය : ජාති, කුල, ආගම්, දේශපාලනය ආදි වශයෙන් අපේ සමාජය අද බෙදී වෙන්වී තිබෙනවා. නමුත් අපි බුදු දහම අනුගමනය කරන සමාජයක්. මේ බෙදීමට සමාජයට බලපාන්නේ කෙසේද?***

පිළිතුර : මේ පිළිබඳව කල්පනා කරන විට ඇත්තටම අපේ රටේ බුදු දහම ක්‍රියාත්මක වෙනවා ද කියා ප්‍රශ්නයක් ඇති වෙනවා. අවුරුදු දෙදහස් පන්සියයක් බුදු දහම සමඟ ජීවත් වූ ජනතාව මේ ආකාරයෙන් බෙදී වෙන්වී ගියේ කෙසේද කියා අපි විමසා බැලිය යුතුයි. මේ ආකාරයන් බෙදුනු ජනතාව ඒකරාශී කරන්නේ කෙසේද කියා අපි කල්පනා කළ යුතුයි.

''අවිරුද්දං විරුද්දේසු - විරුද්ධ නැති තැන් විරුද්ධ කර ගන්න එපා'' ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ඉතා වටිනා ධර්ම විග්‍රහක් කරනවා. අපි හැම තැනම විරුද්ධ කරගෙන තිබෙන්නේ විරුද්ධ නැති දෙයක්. එය අපි නිරන්තරයෙන්ම ජනතාව සමඟ ජීවත් වන නිසා ග්‍රිනෙනවා. අපි වෛරී පුද්ගලයන් කරගෙන තිබෙන්නේ අවෛරී පුද්ගලයන්. එසේ අවෛරී පුද්ගලයන් වෛරී කර ගන්න වරදක් කරගෙන තිබෙන්නේ අපිමයි. මේවා පුද්ගල සිතුම් පැතුම් වල දෝෂ. ඒ නිසා ආත්මාර්ථකාමිත්වය මේ සියල්ලට හේතු වෙනවා. මේ බෙදීම් ඇති කරන්නේ ආත්මාර්ථයෙන් පිරුණු පුද්ගලයන්. අපි හැමෝම ජීවත් වෙන්නේ ඉලක්කම් දෙකක තරම් කෙටි කාලයක්. මේ ලෝකයේ ජීවත් වන හැම මනුෂ්‍යයෙක්ම ඉපදිලා, පැවතිලා, මියයන සුළු කාලයට තමයි මේ හැම දෙයක්ම. මේ තරම් බණ කියන රටක, බණ අහන රටක මෙවැනි ආත්මාර්ථයක් ගොඩ නැගුනේ කෙසේද? මේ ආත්මාර්ථය ඇති වන්නේ හේතුව අධික තෘෂ්ණාව සහ අනුකරණයයි. අනුකරණය අද ලෝකයේ හැම තැනම නිරන්තරයෙන්ම සිදු වන දෙයක්. අන්ධ ලෙස අනුකරණයට යොමු වූ විට මනුෂ්‍යයා කෙලවරක්, මායිමක් නොමැතිව කටයුතු කරනවා. තෘෂ්ණාව අඩු කරගෙන සරලව ජීවත් වන මඟක් බුදුරජාණන් වහන්සේ දේශනා කළා. අපි ගෙදරකට ගිහින් බැලූ විට එහි බොහෝ බඩු බාහිරාදිය ගොඩ ගසා තිබෙනවා. එයින් වැඩියෙන්ම තිබෙන්නේ පාවිච්චි නොකරන දේ. ඒ නිසා අධ්‍යාත්මික ගුණයක් ඇතිව ජීවත් වීමට ධර්මය මූලික කර ගත යුතුයි. ධර්මය දේශනා කරන ආකාරයත් මේ සඳහා බලපානවා. ඇලීම් නැති වන ආකාරයට අපි ධර්මය දේශනා කළ යුතුයි. ඒ නිසා අපේ රටේ ධර්මය දේශනා කරන ආකාරය පිළිබඳව ස්වාමීන් වහන්සේලා විසින් නැවත සිතා බැලිය යුතුයි. මනුෂ්‍යයන්ගේ ජීවිත වල සරල බවක් ඇති කළ යුතුයි. ඒ තුළින් මේ භේද භින්නතාවයන් නැති කරන්න පුළුවන්. ඒ නිසා අලුතින් හැදෙන තරුණ පරාම්පාවේ ජීවිත වලට මේ සරල බව ඇති කරන්න අපි උත්සාහ කළ යුතුයි. දහම තුළින් ඒ පිළිබඳව වටහා දිය යුතුයි.

***ප්‍රශ්නය : යටත් විජිත යුගයට පෙර අපේ ඉතිහාසය තුළ අපට ආදර්ශයක් ලබා ගත හැකි යහපත් යුගයක් තිබුණාද?***

පිළිතුර : අපේ මුළු රටම ගොඩ නැගුනේ බුදු දහම පදනම් කොට ගෙනයි. ඒතරම් අපේ ජීවිත වලට බුදු දහම බලපා තිබුණා. රජවරු, පාලකයෝ සහ ජනතාව අතර දුරස්ථ බවක් තිබුණේ නැහැ. අපේ ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ රජවරු ජනතාව අතර ගොස් ජනතා ප්‍රශ්න දෙස බැලුවා. තව කෙනෙක්ගෙන් ලැබෙන පණිවිඩයකට පමණක් රජතුමා තීරණ ගත්තේ නැහැ. රාත්‍රියකට වෙස් වලාගෙන ගිය බව සඳහන් වන්නේ ඒ නිසා තමයි. තමන්ගේ ඇස් දෙකින් දැකලා, කණින් අහලා ඇත්ත දැන ගත්තා. ඒ නිසා මහ ජනතාව අතර පරතරයක් තිබුණේ නැහැ. බුදු දහම අනුව කටයුතු කළ ජනතාව සාමකාමීව, සාධාරණව, ධාර්මිකව ජීවත් වුණා. පෘතුගීසීන් ලංකාවට පැමිණීමෙන් මෙය වෙනස් වෙන්න විශාල බලපෑමක් ඇති කළා. ලන්දේසීන්, ඉංග්‍රීසීන් පැමිණ පසු ඔවුන්ගේ විදේශීය අදහස් අපට එකතු වුණා. විදේශිකයෝ හැමවිටම බැලුවේ බෙදීම් ඇති කරන්න. එකතු වීම සඳහා විදේශිකයෙක් උදව් කර ගන්නාවා කියන්නේ මුලාවක්. ඔවුන් කිසිදාක අප එකතු කරන්න කටයුතු කරන්නේ නැහැ. අපි භේද භින්න වෙලා ඉන්න තරමට විදේශිකයන් කැමතියි. අපේ ජනතාව නිරන්තරයෙන්ම අපේ කම පිළිබඳව සිතිය යුතුයි. මේ අපේ ආගම, ජාතිය, දේශය යන හැඟීම ජනතාවට ඇතුල් කළ යුතුයි. අපේ ඉතිහාසය අපට ඉතා වැදගත්. අපේ ජනතාවට ඉතිහාසය පිළිබඳ දැනුම නැතිව ගියා. ඒ නිසා ඉතිහාසයේ ඇති වූ නායකයන්ගේ ආදර්ශ අපට නැතිව ගියා.

***ප්‍රශ්නය : අපේ පාලන ක්‍රමය බටහිර ලෝකයෙන් පැමිණි දෙයක්. ප්‍රජාතන්ත්‍රවාදය කියන්නෙත් එවැනි දෙයක්. බටහිර ලෝකය ප්‍රජාතන්ත්‍රවාදය තුළින් කරන්නේ තරගකාරීත්වය, සතුරන් නිර්මාණය කර ගැනීම වැනි අර්බුදකාරී දේ. ඒ නිසා මේ වෙනුවට අපේම කියා ක්‍රමයක් නිර්මාණය කිරීමට අපට ශක්තියක් තිබෙනවාද?***

පිළිතුර : ඇත්තවශයෙන්ම අපේම කියා ක්‍රමයක් තිබෙනවා. අපේ නායකයන්ට, අපේ ජනතාවට දින ගණනක් තුළ අපේ ක්‍රමය නැවත මතු කර ගන්න පුළුවන්. ප්‍රථමයෙන් අපේ උරුමය පිළිබඳව අපි දැන ගත යුතුයි. ගුණ නුවණ දියුණු කරමින් පාලනය කළ යුතුයි. ඒ නිසා රටේ නායකයින් එක්තරා දුරකට ධර්මානුකූල විය යුතුයි. පරාක්‍රමබාහු රජතුමා සිහිපත් කර බලමු. එතුමා ත්‍රිපිටක ධර්මය කට පාඩම් කළා. උදෑසන රාජසභාවට රැස්වෙලා අවශ්‍ය කටයුතු අවසන් කොට, අනතුරුව රජතුමා ආරාම වලට ගොස් පොඩි හාමුදුරුවරුන්ට ධර්මය උගන්වනවා. ඒ ආකාරයෙන් එතුමාගේ ජීවිතය ජනතාව සමඟ බද්ධ වෙලා තිබුණා. මනුෂ්‍යයෙක් වෙනස් කරන්න ධර්මයට සුවිශේෂී හැකියාවක් තිබෙනවා. බෞද්ධ දරුවන් බෞද්ධ දර්ශනයෙන් පෝෂණය කළ යුතුයි. කතෝලික දරුවන් ඒ දහමින් පෝෂණය කළ

යුතුයි. මුස්ලිම් දරුවන් ඒ ආගම අනුව පෝෂණය කළ යුතුයි. අපි භේද විය යුතු නැහැ. ඒ නිසා අපේ රටේ ජනතාවට සැහැල්ලුවෙන්, සරලව ජීවත් වෙන්න තම තමන්ගේ ආගම් පාවිච්චි කරන්න පුළුවන්. අපේ රටේ නායකත්වයට පැමිණෙන අය අපේ ජනතාවගේ අදහස් උදහස් තේරුම් ගෙන ජනතාවට අවශ්‍ය දේ දිය යුතුයි. එය කළ යුත්තේ ධර්මානුබෝධය තුළින්. ගෝලීයකරණය අනුව ගමන් කරන ලෝකයක වෙනත් ෆ්‍රීනීම් ලබා ගන්නා අතරම අපේ රටේ දහම, සංස්කෘතිය, උරුමය අනුව ගමන් කරන නායකත්වයක් අපට අවශ්‍ය කරනවා.

***ප්‍රශ්නය : අපේ දහම් පාසල් අධ්‍යාපනය තුළ යම් වෙනසක් ඇති කළ යුතුද?***

පිළිතුර : ධර්මය බෙදන පාසල දහම් පාසලයි. සතියේ දවස් පහක් දරුවා පාසලට යනවා. පාසලේ අධ්‍යාපනය තුළින් ලැබෙන්නේ රාගයෙන් රත්වෙන, ද්වේශයෙන් බර වෙන, මෝහයට යොමු වන දහමක්. අවාසනාවකට අපේ රටේ ෆ්‍රීනට තිබෙන්නේ එවැනි අධ්‍යාපන ක්‍රමයක්. දවස් පහක් මනස රත් කර ගන්න දරුවාට මනස නිවා ගන්න දහම් පාසලින් පුළුවන්. නමුත් අද ලංකාවේ බොහෝ දහම් පාසල් වල සිදුවන්නේ ධර්මය බෙදීමට වඩා තරගාකාරීත්වයකට යොමු කිරීමක්. අපේ රටේ අනාගතය භාර ගන්න ඉන්නේ අපේ දරුවන්ව තරගයට යොමු කිරීමෙන් ඔහු තුළ ලෝභ, ද්වේශ, මෝහ වැඩි වෙනවා. මෙයින් අදහස් කරන්නේ විභාග තහනම් කිරීම නොවෙයි. පාසලෙත් තරගයට මුහුණදෙන දරුවාට, දහම් පාසල තුළදීත් තරගයකට මුහුණ දීමට සිදු වුවහොත් මහා විනාශයක් ඇති වෙනවා. ඒ නිසා දහම් පාසල් අධ්‍යාපන ක්‍රමය පිළිබඳව තේරුම් ගෙන සම්පූර්ණයෙන්ම දරුවාගේ හිත, ගත නිවෙන දහමක් ලබා දිය යුතුයි. මේ හිත, ගත නිවීමෙන් දරුවා සැනසිල්ල කියන දේ භුක්ති විදිනවා. ඒ නිසා දහම් පාසල් වල ස්වාමීන් වහන්සේලා මේ පිළිබඳව අවබෝධ කරගෙන ධර්ම පමණක් දරුවාට ලබා දිය යුතුයි. මල් නැටුමයි, ගායනයයි, වාදනයයි පමණක් ඉගැන්වීම ප්‍රමාණවත් නැහැ. ඒ නිසා දහම් පාසල් අධ්‍යාපනය තුළින් දරුවන්ට ධර්මමය අධ්‍යාපනයක් ලබා දිය යුතුයි. විනය ආරක්ෂා වන්නේ ධර්මය තුළින්. ඒ නිසා ධර්ම රකින්න විනය අවශ්‍යයි. විනය රකින්න ධර්මය අවශ්‍යයි. මේ ධර්ම විනය රකින තැනක 'ගුණය' කියන දේ ආරක්ෂා වෙනවා.

***ප්‍රශ්නය : මේ දෙය නිවැරදිව සිදු කරන රටවල් තිබෙනවාද? අපට ඒයින් ආදර්ශ ලබා ගත හැකිද?***

පිළිතුර : අපේ රට දිහා බලා ''ශ්‍රී ලංකාව වගේ අපේ සිංගප්පූරුව සෑදිය යුතුයි'' කියා සිංගප්පූරුවේ හිටපු නායකයෙක් වන ලී ක්වාන් යු මහතා ප්‍රකාශ කොට තිබෙනවා. එයින් අවුරුදු විසිපහක් යන්න ප්‍රථම සිංගප්පූරුව ලෝව ප්‍රබල රටක් බවට වුණා. රටක් වෙනස් කරන්න නායකයෙකුට හැකි බව මෙයින් පෙනෙනවා. නායකයාගේ තීරණ නිවැරදි විය යුතුයි.

ඉන්දියාවේ කෝටි සියයක් පමණ ජනතාව සිටිනවා. ආගම් ගණනාවක් තිබෙනවා. නමුත් ඉන්දියාවේ ධර්ම විනය ආරක්ෂා වී තිබෙනවා. අපේ රටේ මිනිසුන්ට වඩා ගුණයක් ඒ මිනිසුන් තුළ තිබෙනවා. ඒ නිසා අසල්වාසී ආසියාතික රටවල් හරිම වාසනාවන්තයි. අපිට උප්පතියෙන්ම ආගමක්, දහමක් ලැබී තිබෙනවා. ඒ නිසා අලුතින් හොයන්න දෙයක් නැහැ.

***ප්‍රශ්නය : ස්වාමින් වහන්ස, ඉන්දියාව ඉතා විශාල රටක්. ඔවුන්ට සමාජමය ප්‍රශ්න, අභියෝග රාශියක් තිබෙනවා. නමුත් ඔවුන්ට එය නිවැරදිව කිරීමට හැකි වූයේ කෙසේද?***

පිළිතුර : ඉන්දියාවේ පත්වෙන හැම නායකයෙක්ම යම් ප්‍රතිපත්තියකට අනුව කටයුතු කරනවා. ඉන්දියාවේ තියෙන්නේ එකම ප්‍රතිපත්තියයි. නායකයෝ වෙනස් වුණාට ප්‍රතිපත්ති වෙනස් වෙන්නේ නැහැ. සෑම විටම පත්වෙන්නේ නිවුණු නායකයෙක්. නායකයාගේ මේ නිවීම තුළ ජනතාවගේ නිවීම ඇති කරන්න පුළුවන්. අපට ඉන්දියාවෙන් බොහෝ දේ ඉගෙන ගන්න තිබෙනවා. අපි ඇති වෙලා තිබෙන්නෙත් ඉන්දියාවෙන් ආදර්ශ අරගෙනයි. අද අපි බටහිර අනුගමනය කිරීමට ගොස් වැනසිලා තිබෙනවා. ආර්ථික හා අධ්‍යාත්මික වශයෙන් බොහෝ දේ අපිට ඉන්දියාවෙන් ඉගෙන ගන්න පුළුවන්.

***ප්‍රශ්නය : හැම දෙනාටම පාලකයෙක් වෙන්න බැහැ. පාලනය කරන්න බැහැ. ඒ වෙනස පුද්ගලයාට කරන්න පුළුවන් කෙසේද?***

පිළිතුර : ''පළමුවෙන්ම මනුෂ්‍යයෙක්ට ගුණ යහපත් පුද්ගලයෙක් වීමට අවශ්‍ය නම් කුඩා කළ සිටම තමන් තමන්ට ආදරය කළ යුතුයි. තමන්ගේ ආත්ම භාවට ආදරය කළ යුතුයි.'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනා කොට තිබෙනවා. එවිට තමන් වැනසීමට කොයිම මොහොතකවත් තමා කැමැති වන්නේ නැහැ. තමන් තමන්ට ආදරය කරමින්, කුඩා, තරුණ, මහලු යන ජීවිතයේ තුන් යාමයෙන් එක් යාමයක්වත් නිවුණු ජීවිතයක් පවත්වාගැනීමට උත්සාහ කළ යුතුයි. ඒ අනුව පිංවන්ත ජීවිතයක් ගත කළ යුතුයි. හැම පුද්ගලයෙක්ට ම තමන් තුළින් තමන්ට නිවෙන්න පුළුවන්. ඒ සඳහා නිරන්තරයෙන්ම පුද්ගලයන්ට, තමන්ව ප්‍රිකීමට හුරු කළ යුතුයි. අපේ අධ්‍යාපන ක්‍රමයේ තිබෙන්නේ තමන්ගේ දුර්වලකම නොප්‍රික, අනුන්ගේ දුර්වලකම ප්‍රිකීමට උත්සාහ කිරීමයි. අනුන් දිහා බලන තාක් කල් අපට හැදෙන්න බැහැ. තමන් දිහා බලන තරමට පුද්ගලයා තුළ අවබෝධය ඇති වෙනවා. තමන් දුර්වලයෙක් නම් අන් අය හදන්න බැහැ. ඒ නිසා අපේ රටේ ජනතාවට තමන් තමන් දෙස බැලීමට හුරු කළ යුතුයි.

***ප්‍රශ්නය : ගෝලීයකරණයට ලක් වී තිබෙන වර්තමාන ලෝකයට බුදු දහම තුළින් තෑග්ගක් දෙන්න අපට හැකියාව තිබෙනවා. අපි මෙය ඉදිරියට ගෙන යන්නේ කෙසේද?***

පිළිතුර : අපේ රටින් ලොව දුන් දායාදය ''බුදු දහම'' නිසා අපේ රට ධර්මද්වීපය ලෙස නම කළා. අපේ රටින් ඇති වූ බුදු දහමේ ප්‍රබෝධය තායිලන්තය, බුරුමය, කාම්බෝජය, ලාඕසයට පැතිර ගියා. බුදුරජාණන් වහන්සේගෙන් අපේ ජනතාව ලබා ගත් දර්ශනය මුළු ආසියාවටම බෙදිලා ගියා. අපේ රටින් ලබා දුන් දහම තුළින් ආසියාතික රට වල මිනිසුන් දියුණු වුණා. මේ ධර්මකාමී ජීවිතය අපේ රටේ පැරැණි උරුමයක්. ධර්මයකට නැඹුරු වූ ජීවිතය නැවත වාරයක් ඇති කරවිය යුතුයි. එය කළ නොහැක්කක් නොවේ. අද අපේ රටේ ජනතාවට අවශ්‍ය වී තිබෙන්නේ සැනසිල්ලේ ජීවත් විය හැකි ක්‍රමයක්. ජනතාව සනසනවාද? නැතිනම් වනසනවාද? කියා නායකයා තීරණය කළ යුතුයි. මේ තරම් අහිංසක ප්‍රාර්ථනාවක සිටින ජනතාවක් හදන්න අපහසු නැහැ. අපේ ජනතාවගේ ගුණය පිරිහිලා නැහැ. අපේ සාමාන්‍ය ජනතාවගේ සාරධර්ම වැනසිලා නැහැ. මේ වල් වැදුණු නීතිය මේ සාරධර්ම, ගුණධර්ම නැති කර ගන්න හේතු වෙලා තිබෙනවා. හැම රටකටම නීතිය ඉතා වැදගත්. ධර්මයක් නැති රටක වුවත් නීතියෙන් මිනිසුන් හික්මවා තිබෙනවා. අපේ රටට මේ දෙකම තිබෙනවා. අපිට ධර්මයයි, නීතියයි දෙකම තිබෙනවා. ධර්මය පැත්තෙන් සංවර වෙන මනුෂ්‍යයා, නිතියෙන් ද සංවර කිරීමට හැකි නම් අපේ රට බොහෝම පහසුවෙන් හදා ගන්න පුළුවන්. භික්ෂූන් වහන්සේලා වශයෙන් අපිට මිනිසුන් ධර්මයෙන් හික්මවාගෙන ගියත්, නීතිය අවිනීතියක් වශයෙන් ක්‍රියාත්මක වෙනවා නම්, නීතිය වල් වැදිලා නම් වැඩක් වන්නේ නැහැ. දුප්පත් පොහොසත් භේදයකින් තොරව නීතිය ක්‍රියාත්මක විය යුතුයි. හැම දෙනාටම සාධාරණ විය යුතුයි. පාලකයා නීතිය ආරක්ෂා කළ යුතුයි. නීතිය ක්‍රියාත්මක කළ යුතුයි. ඒ නිසා පාලකයා නීති ගරුක, විනය ගරුක විය යුතුයි. ඒ අනුව ක්‍රියා කළ විට ජනතාව සන්සුන් කර ගැනීම අපහසු නැහැ.

***ප්‍රශ්නය : සමාජයට, ජනතාවට දීමට එක් උපදෙසක් තිබෙනවානම් එය කුමක්ද ස්වාමීන් වහන්ස?***

පිළිතුර : අපේ රත්තරන් දෙමාපියනේ, රත්තරන් තරුණ දුවේ, පුතේ, කුඩා දරුවනේ මම ඉතා කරුණාවෙන් මෛත්‍රියෙන් ආයාචනයක් කරනවා. හැඟීම් කුපිත වන බව ඇත්ත. නමුත් උදේ අවදි වූ වේලාවේ සිට රාත්‍රියට නින්දට යන තුරු අපි දිහා බලමින්, එදිනෙදා දෛනික කටයුතු වලට අපේ සිතුවිලි නිවීමෙන් සිතීමට, අපේ වචන නිවීමෙන් කතා කිරීමට, අපේ ක්‍රියා නිවීමෙන් කිරීමට අපිට හැකි නම් අපේ වටා සිටින අයත් නිවන්න හැකියාව අපට තිබෙනවා. ''සමනාණංච දස්සනං - ඒතං මංගල මුත්තමං'' යනුවෙන් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ

දේශනා කොට තිබෙනවා. සමනය වූ සිතක් ඇති පුද්ගලයෙක් දැකීම මංගල කාරණයක්. දෙමාපියන්ගේ සිත් නිවන දරුවන් වෙන්න හැකිනම්, දරුවන්ගේ සිත් නිවන දෙමාපියන් වෙන්න හැකිනම්, ජනතාවගේ සිත් නිවන නායකයන් වෙන්න හැකිනම්, ජනතාව හැටියට නායකයා නිවුණු පුද්ගලයෙක් ලෙස ආරක්ෂා කර ගැනීමට හැකි නම් අපේ රටේ ජනතාවට දිගු ගමනක් යන්න වාසනාව තිබෙනවා. තෙරුවන් සරණයි !

ස්තූතියි ස්වාමින් වහන්ස.